ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

ජනාධිපති චක්‍රලේඛ : SD/NFPU/18/17

2017 සැප්තැම්බර් මස 04 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

**ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය- 2017**

දිවයින තුල හැකි උපරිමයෙන් ආහාර නිෂ්පාදනය සිදුකර ආනයන සීමා කිරීමත්, ආහාර නිෂ්පාදනය සම්බන්ධයෙන් ස්වයංපෝෂිත තත්වයක් ඇති කිරීමත් ප්‍රධාන අරමුණු කරගනිමින් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ආරම්භ විය. එහෙත් පසුගිය වගා කන්න කිහිපය තුල (2016-2017) පැවති අයහපත් කාලගුණික තත්වයන් (නියඟය හා ගංවතුර) හේතුවෙන් රටේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය දැඩි පසුබෑමකට ලක්ව ඇත. එම පසුබෑම් තත්ත්වයන් මහහරවා ගනිමින් 2017/18 මහ කන්නය ආහාර නිෂ්පාදනයේ නව ප්‍රබෝධයකින් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, ගොවි ප්‍රජාව මෙන්ම පෞද්ගලික අංශයේ දායකත්වයෙන් කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය ආරම්භක සතිය ලෙස 2017 ඔක්තෝම්බර් මස 06 වන දින සිට 12 වන දින දක්වා කාලය නම් කර ඇත. එම කාලය තුළ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සියළු පාර්ශවවල සහභාගිත්වය හා අවධානය ලබාගත හැකිවන පරිදි දිවයින පුරා විශේෂ ක්‍රියාකාරකම් දියත් කල යුතුය.

මෙහි දී ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සියළුම රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ගේ සක්‍රිය දායකත්වය ලබාගත හැකි පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම ආයතන ප්‍රධානීන් විසින් සිදුකල යුතුය. ඒ අනුව එක් එක් ආයතනවල ස්වභාවය, පිහිටීම, සේවක ප්‍රමාණය ආදිය සැලකිල්ලට ගනිමින් ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී පහත කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කල යුතුය,

01. වගා කිරීමට ඉඩ පහසුකම් ඇති සෑම රාජ්‍ය ආයතන පරිශ්‍රයකම ගෙවතු වගාවන් ආරම්භ කිරීම සහ ඒවා පවත්වාගෙන යාමට වැඩපිළිවෙලක් දියත් කිරීම.

02. සියළුම රාජ්‍ය සේවකයින් විසින් තම පෞද්ගලික ගෙවත්තේ (වගා කිරීමට ඉඩ පහසුකම් සහිත) අවම වශයෙන් ආහාරමය වටිනාකමක් සහිත එක් පැලයක් සහ එක් පළතුරු පැලයක් බැගින්වත් සිටුවීම.

03. යහපත් ආහාර පාරිභෝජන රටා සහ ආහාර නාස්තිය අවම කිරීම පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම.

...වදොර, කොළඹ 01 / ...கத்திடல், கொழும்பு 01 / ...Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

තවද මෙම වැඩපිළිවෙලට ආශිර්වාද ලබාගැනිම සඳහා 2017 ඔක්තෝම්බර් 05 වන දින සුදුසු පරිදි සර්ව ආගමික වතාවන් සංවිධානය කිරිමට ද අවධානය යොමු කල යුතුය.

මෙම කටයුතු පිළිබඳව ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එක් එක් ආයතන විසින් සිදු කළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තාවක් මා වෙත ලබාදිය යුතු බව ද කාරුණිකව දන්වමි.

**ඔස්ටින් ප්‍රනාන්දු**
ජනාධිපති ලේකම්

පිටපත :

01. කැබිනට් අමාත්‍යවරුන්
02. ආණ්ඩුකාරවරුන්
03. පළාත් ප්‍රධාන අමාත්‍යවරුන්
04. රාජ්‍ය අමාත්‍යවරුන්
05. නියෝජ්‍ය අමාත්‍යවරුන්
06. පළාත් අමාත්‍යවරුන්

} දැ.ගැ.පි හා අවශ්‍ය සහය ලබාදීම සඳහා